**කොවිඩ් 19 සති පාසල - 2021**

**සබරගමුව පළාත - නිවිතිගල අධ්‍යාපන කලාපය**

**9 ශ්‍රේණිය - ඉතිහාසය - 2021**

**පැවරුම අංක 4 – (4වන වන සතිය)**

**ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හා ජාතික නිදහස් ව්‍යාපාරය.**

ක්‍රියාකාරකම - ලංකාවේ ජාතික සංගමය බිහිවීම හා මැනින් ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය .

හැඳින්වීම - විසිවන සියවසේ මුල් භාගය තුළ මෙරට වර්ධනය වෙමින් පැවති මධ්‍යම පාන්තික තරුණ කොටස් විවිධ කුඩා කුඩා සංවිධානය පිහිටුවා ගනිමින් බ්‍රිතාන්‍යයන් හට දේශපාලනික ප්‍රතිසංස්කරණ ඇති කරන ලෙස බලපෑම් කළ ද එය සාර්ථක නොවීය. එවැනි පසුබිමක් තුළ බ්‍රිතාන්‍යයන්ට විරුද්ධව ශක්තිමත් හඬක් නැගීමට නම් සියලු දෙනාගේ සහයෝගයෙන් ගොඩනැගුණු පොදු සංවිධානයක අවශ්‍යතාවය මතුවිය. මේ වන විට ඉන්දියාව තුළ ජාතික සංගමය පිහිටුවා ගනිමින් එක්සත් ව කටයුතු කරන ආකාරය ආදර්ශයට ගත් ලාංකික මධ්‍යම පාන්තික තරුණ තරුණියන් 1919 දී ලංකා ජාතික සංගමය පිහිටුවා ගනිමින් එම සංවිධානය විසින් ගෙන ගෙනගිය උද්ඝෝෂණ වල ප්‍රතිඵලයක් ලෙස 1920 මැනිං ප්‍රතිසංස්කරණ දිනා ගැනීමට හැකි විය.

පියවර 1 - පිටු අංක 103 සිට 105 දක්වා හොඳින් කියවන්න.

පියවර 02 - පසුගිය සතියේ සටහන් අවසන් කළ ස්ථානයට යමින් ඉහතින් ලබාදී ඇති හැඳින්වීම සටහන් කර ගන්න

පියවර 3 - පසුව පහතින් දී ඇති ප්‍රශ්නාවලි සඳහා පිළිතුරු සපයන්න.

(එහිදී පිළිතුරු ලිවීමට පෙර අදාළ ප්‍රශ්නය සටහන් කර කර ගැනීම අනිවාර්ය වේ.)

**ප්‍රශ්නාවලිය**

1. ලංකා ජාතික සංගමය බිහිවීමට බලපෑ ප්‍රධාන සිදුවීම් දෙක කුමක්ද ?
2. ලංකා ජාතික සංගමය බිහි වූ වර්ෂය ලියා දක්වන්න.
3. ලංකා ජාතික සංගමය බිහිවීමේදී ඒකරාශී වූ සංවිධානය මොනවාද ?
4. ලංකා ජාතික සංගමයේ ප්‍රථම සභාපතිවරයා කවුරුනද?
5. ලංකා ජාතික සංගමයේ ප්‍රධාන අරමුණු වූයේ මොනවාද?
6. සිය අරමුණ දිනා ගැනීමට ලංකා ජාතික සංගමය අනුගමනය කළ ක්‍රියාමාර්ග ලියා දක්වන්න.
7. මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ලබා දෙන අවධියේ දී මෙරට බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා වන්නේ ?
8. මැනිං සංස්කරණයේ ව්‍යවස්ථාදායක සභාවේ සංයුතිය ඇඳ දක්වන්න.
9. මැනිං ප්‍රතිසංස්කරණයේ කැපී පෙනෙන වැදගත් කමක් ලියා දක්වන්න.

10. මැනින් ප්‍රතිසංස්කරණ පැවැති දුර්වලතා ලියා දක්වන්න.

සැකසුම

උදාර අරවින්ද මයා -

කලවාන ජාතික පාසල - නිවිතිගල අධ්‍යාපන කලාපය